මාපා ගුරුගෙදර

# English ABCD


හෝඩිය, අත්අකුරු සහ ශබ්දකෝෂ භාවිතය

**The English course every primary child must follow**
**සෑම ප්‍රාථමික දරුවෙක් ම හැදෑරිය යුතු ඉංග්‍රීසි පාඨමාලාව**
**ஒவ்வொரு ஆரம்பப் பிள்ளையும் படிக்க வேண்டிய ஆங்கில பாடநெறி**

උපදෙස්

සිංහල

පාඨමාලාව හැදෑරීමට පෙර හොඳින් කියවන්න.




## <u>කණිෂ්ක ජයතිලක ගුරුතුමාගෙන්</u>

## <u>බුද්ධිමත් ව ක්‍රියාකිරීම සඳහා</u>

## <u>දෙමාපියන් වෙත පණිවිඩයක්!!!</u>

ඔබේ දරුවාගේ ඉංග්‍රීසි ඉගෙනුම වෙනුවෙන්
ගුරුතුමාගේ උපදෙස් සහිත ව
ඔබ දිනපතා වැය කරන විනාඩි 5ක්
දිනෙක ඔබේ දරුවාගේ හිස මත
A කිරුළ පළඳවනු ඇත.

**<u>මතක තබා ගන්න.</u>**

කුඩා දරුවකුගේ සාර්ථකත්වයේ
ප්‍රධාන රහස
මවගේ කැපවීමයි.

සෑම ප්‍රාථමික ශිෂ්‍යයෙකු ම හැදෑරිය යුතු ඉංග්‍රීසි පාඨමාලාව - **“English ABCD”** වෙත සාදරයෙන් පිළිගනිමු.

**“English ABCD”** "සම්පූර්ණ ඉංග්‍රීසි විසඳුම"හි 1 වන පාඨමාලාව යි.

**මෙම කට්ටලය තුළ පහත දෑ ඇතුළත් ය.**

1. උපදෙස් අත්පොත
   (හොඳ ම ප්‍රතිඵලය ලබා ගැනීම සඳහා පාඨමාලාව හදාරන්නේ කෙසේද යන්න දැනගැනීම පිණිස පාඨමාලාව ආරම්භ කිරීමට පෙර ප්‍රවේශමෙන් කියවීම සඳහා)
2. ඉංග්‍රීසි හෝඩිය - පොත
3. කැපිටල් අකුරු - කාඩ්පත
4. සිම්පල් අකුරු - කාඩ්පත
5. තනි අකුරු ලියමු - පොත
6. පිටපත් ලියමු I - පොත
7. පිටපත් ලියමු II - පොත
8. ළමුන් සඳහා කතන්දර - පොත (බලා ලිවීම සඳහා පමණි.)
9. අකාරාදි පිළිවෙල - පොත
10. ප්‍රශ්න පත්‍ර
    I. කැපිටල් සිම්පල් පරීක්ෂණය (කොළ 6යි.)
    II. පිටපත් ලිවීම පරීක්ෂණය (කොළ 4යි.)
    III. අකාරාදි පිළිවෙළ පරීක්ෂණය (කොළ 2යි.)
11. වඩා හොඳ ඉගෙනුමක් සඳහා තවත් ඉගෙනුම් ආධාරක - විස්තර පත්‍රිකාව

කිසිවක් අඩු නැති බව පරීක්ෂා කර තහවුරු කර ගන්න.

<u>**මෙම පාඨමාලාවේ අරමුණ**</u>

මෙම පාඨමාලාවේ අරමුණු තුනකි.

1. ඉංග්‍රීසි හෝඩියේ අකුරු 26 කැපිටල් සහ සිම්පල් ලෙස වෙන වෙන ම නිවැරදි ව හඳුනා ගැනීම
2. නිවැරදි හැඩයෙන් සහ උසින් යුතු ව ලස්සන අත්අකුරු ලිවීමට හුරුවීම
3. යම් කිසි නොදන්නා හෝ සැක සහිත ඉංග්‍රීසි වචනයක් ශබ්දකෝෂයකින් බලා ගැනීමට ඉගෙනීම
   ශබ්දකෝෂ භාවිතය පිළිබඳ ඇතිකරගන්නා මෙම හුරුව අ. පො. ස. (සා./පෙ.) ඉංග්‍රීසි සඳහා ඉහල ම ප්‍රතිඵලයක් කරා යාමට අතිශයින් ම ප්‍රයෝජනවත් වනු ඇත.

<u>**"සම්පූර්ණ ඉංග්‍රීසි විසඳුම"හි අනෙකුත් පාඨමාලා සමඟ මෙම පාඨමාලාවේ සම්බන්ධය**</u>

මෙම **“English ABCD”** පාඨමාලාව හදාරන අතරතුර ශිෂ්‍යයාට "මගේ පළමු වචන 1000" හැදෑරිය හැක. එකවර පාඨමාලා දෙක ම ආරම්භ කරන්න. නමුත්

ශිෂ්‍යයා "මගේ පළමු වචන 1000"හි "නම් ලියමු; කියවමු" වෙත පැමිණෙන විට **"English ABCD"** අවසන් කර තිබිය යුතු ය.

**ශිෂ්‍යයා පෙළඹවීම**

ශිෂ්‍යයා මෙම **"English ABCD"** පාඨමාලාවේ එක් එක් පියවරක් සම්පූර්ණ කළ බවට ගුරුතුමා සෑහීමට පත්වන්නේ නම් පමණක් ගුරුතුමාට එම ශිෂ්‍යයාගේ ප්‍රගති සටහනෙහි (2 පිටුව) අදාළ කොටුව වර්ණ ගැන්විය හැක.

ශිෂ්‍යයා පෙළඹවීම සඳහා ඔහුගේ ප්‍රගති සටහනෙහි අදාළ කොටු වර්ණ ගැන්වීමේ ක්‍රියාව **"English ABCD"** පාඨමාලාව තුළ දී පමණක් නොව "සම්පූර්ණ ඉංග්‍රීසි විසඳුම"හි ඇතුළත් අනෙකුත් පාඨමාලා තුන තුළ දී ද ක්‍රියාත්මක කිරීමට මතක තබා ගත යුතු ය.

**ශිෂ්‍යයා පෙළඹවීම සඳහා තවත් එක් ක්‍රමයක්:**

ප්‍රගති සටහනෙහි එක් කොටුවක් වර්ණ ගැන්වූ විට ළඟා කරගත් සාධනය අගය කරමින් ශිෂ්‍යයාට ත්‍යාගයක් ලබා දිය හැකි ය. ගුරුතුමාට තනි ව හෝ දෙමව්පියන් සමඟ සාකච්ඡා කිරීමෙන් හෝ දිය යුතු ත්‍යාගය පිළිබඳ ව තීරණය කළ හැකි ය.

## **"English ABCD" පාඨමාලාව හැදෑරීම සඳහා උපදෙස් / පියවර**

**********************************************************

මුද්‍රිත හෝඩියක් දෙස නොබලමින් දරුවාට හෝඩියේ අකුරු 26 නිවැරදි පිළිවෙලට නිවැරදි උච්චාරණයෙන් යුතු ව කීමට හැකි නම් (ගීයක් ලෙස ගයමින් හෝ එසේ නොමැති ව), එම හැකියාව වාසි සහගත වේ. S (එස්) සහ X (එක්ස්) යන අකුරු දෙක දරුවාට නිවැරදි ව උච්චාරණය කළ හැකි ද යන්න විශේෂයෙන් සොයා බැලිය යුතු ය. සමහර විට එම නිවැරදි උච්චාරණ හැකියාව ළඟාකර ගැනීම සඳහා යම් දීර්ඝ කාලයක් ගතවීමට ද ඉඩ ඇත.

**********************************************************

**1 වන පියවර - ඉංග්‍රීසි අකුරු එක එකක් නිවැරදි ව හඳුනා ගැනීම**

මේ සඳහා "ඉංග්‍රීසි හෝඩිය" පොත ගන්න.

1. පළමු ව කැපිටල් අකුරු දැක්වෙන පිටු දෙක ගන්න.
   එක් එක් අකුර මත ඇඟිල්ල තබමින් අකුරු 26 කියන්නට දරුවාට උදව් කරන්න.
2. දෙවනු ව සිම්පල් අකුරු දැක්වෙන පිටු දෙක ගන්න.
   එක් එක් අකුර මත ඇඟිල්ල තබමින් අකුරු 26 කියන්නට දරුවාට උදව් කරන්න.
3. තෙවනු ව කැපිටල් සහ සිම්පල් අකුරු දැක්වෙන පිටු දෙක ගන්න.
   එක් එක් අකුර මත ඇඟිල්ල තබමින් අකුරු 52 කියන්නට දරුවාට උදව් කරන්න. (කැපිටල් ඒ, සිම්පල් ඒ, කැපිටල් බී, සිම්පල් බී, කැපිටල් සී, සිම්පල් සී ............ ලෙස)

දරුවා අකුර කීවත් එක් එක් අකුරේ හැඩය තවමත් දරුවාගේ මතකයේ නැත. එක්



www.MAPAIK.com

එක් අකුරේ හැඩය මතක තබාගැනීම සඳහා ඉංග්‍රීසි හෝඩිය කාඩ් පත් දෙක ගන්න.

1. කැපිටල් කාඩ් පතෙහි එක් එක් අකුර වෙන් වන සේ කපාගන්න.
2. අකුරු කියමින් කාඩ් පත් 26 පෙළගැස්වීමට දරුවාට උදව් කරන්න.
   (දරුවා පෙළගස්වන එක් එක් කැපිටල් අකුරේ හැඩය දැන් දරුවාගේ මතකයෙහි ඇත. තවමත් යම් අකුරක හැඩය මතකයෙහි නොමැති නම් එය පෙළගැස්වීම දරුවාට තරමක් අපහසු වනු ඇත.)
3. සිම්පල් කාඩ් පතෙහි එක් එක් අකුර වෙන් වන සේ කපාගන්න.
4. අකුරු කියමින් කාඩ් පත් 26 පෙළගැස්වීමට දරුවාට උදව් කරන්න.
   (දරුවා පෙළගස්වන එක් එක් සිම්පල් අකුරේ හැඩය දැන් දරුවාගේ මතකයෙහි ඇත. තවමත් යම් අකුරක හැඩය මතකයෙහි නොමැති නම් එය පෙළගැස්වීම දරුවාට තරමක් අපහසු වනු ඇත.)
5. කැපිටල් සහ සිම්පල් අකුරු කාඩ් පත් දෙක ම එක ළඟ තබමින් කාඩ් පත් 52 ම පෙළගැස්වීමට දරුවාට උදව් කරන්න.
   (දැන් දරුවාට කැපිටල් සහ සිම්පල් අකුරු එක එකක් ඉතා හොඳින් හඳුනා ගැනීමට හැක.)

ඉහත පරිදි අකුරු පෙළගැස්වීමේ දී අකුරු උඩ යට මාරුවීම වළක්වා ගැනීම සඳහා සෑම අකුරු කාඩ්පතක ම ඉහළ දකුණු කෙළවරේ නිල් පැහැති ත්‍රිකෝණ හැඩයක් ඇඳ ඇති බව සැලකිල්ලට ගන්න.

**අමතර ක්‍රියාකාරකම්**

1. අහඹු ලෙස පවසන යම් අකුරක් සෙවීමට දරුවාට පැවසීම
   - පළමු අවස්ථාව- කැපිටල් කාඩ් පත් 26 පමණක් ගෙන
   - දෙවන අවස්ථාව- සිම්පල් කාඩ් පත් 26 පමණක් ගෙන
   - තෙවන අවස්ථාව- කැපිටල් සහ සිම්පල් කාඩ් පත් 52 ම ගෙන
2. යම් කැපිටල් අකුරක් සහිත කාඩ් පතක් පෙන්වන විට එම අකුරේ සිම්පල් අකුර සහිත කාඩ් පත පෙන්වන ලෙස සහ යම් සිම්පල් අකුරක් සහිත කාඩ් පතක් පෙන්වන විට එම අකුරේ කැපිටල් අකුර සහිත කාඩ් පත පෙන්වන ලෙස දරුවාට පැවසීම

මෙම ප්‍රධාන ක්‍රියාකාරකමේ දී ද අමතර ක්‍රියාකාරකම්වල දී ද දරුවාගේ නිවැරදි පිළිතුරු හොඳින් අගය කිරීමත් වැරදි පිළිතුරු ලබා දුන් අවස්ථාවල ඉවසීමෙන් හා කරුණාවෙන් යුතු ව නිවැරදි පිළිතුර දරුවාට පැවසීමත් ඉතා වැදගත් වේ.

මෙම ක්‍රියාකාරකම් අවස්ථා කීපයක් කරන විට දරුවාට එම අකුරු මතකයේ තබා ගැනීමට හැකිවනු ඇත. දරුවාගේ බුද්ධියේ සහ මතකයේ ප්‍රමාණය මත අවස්ථා ගණන තීරණය වනු ඇත. (බුද්ධිය සහ මතකය සාධක ගණනාවක ප්‍රතිඵලයකි.) එම නිසා දරුවා සමඟ මෙම ක්‍රියාකාරකම් කිරීමේ දී ඊට සහය වන ගුරුතුමාගේ / ගුරුතුමියගේ / මවගේ / වෙනත් අයකුගේ ඉවසීම, දඬුවමින් වැලකීම, දරුවා කෙරෙහි අනුකම්පා සහගත වීම, බලාපොරොත්තු සහගත වීම යනාදී ගුණාංග දරුවාට ප්‍රියජනක ඉගෙනුම් අත්දැකීමක් හිමිකර දෙනු ඇත.

**අකුරුවල හැඩ මතක තබා ගැනීමට අපහසු විට කළ හැකි ක්‍රියාකාරකම්**

1. මතක තබා ගැනීමට අපහසු අකුර / අකුරු දරුවාට නිතර නිතර පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කිරීම

A a ඒ

B b බී

2. කැපිටල් සහ සිම්පල් අකුරු ඇඳ පාට කිරීම
(මෙලෙස පාට කළ අකුරු ද ප්‍රදර්ශනය කළ හැක.)

A a

B b

3. කැපිටල් සහ සිම්පල් අකුරු යා කිරීම
(දරුවා මේ වන විටත් මතක තබා ගෙන ඇති අකුරු දෙකක් හෝ තුනක් සමඟ දරුවාට මතක තබා ගැනීමට අපහසු අකුරු එකක් හෝ දෙකක් මිශ්‍ර කර මෙම අභ්‍යාසය සාදා ගත හැක.)

| | |
|---|---|
| A | d |
| B | c |
| C | b |
| D | a |

4. පිටපත් ලිවීම
(මෙම අවස්ථාවේ දී එක් එක් අකුරේ නිවැරදි ම උස සහ හැඩය බලාපොරොත්තු නොවේ. මේ සඳහා දරුවා සාමාන්‍යයෙන් ලිවීම සඳහා භාවිතා කරන තනි රූල් අභ්‍යාස පොතක් භාවිතා කළ හැක.)

A a ඒ B b බී

5. මතක තබා ගැනීමට අපහසු අකුර රූපයක් සමඟ පෙන්වීම / ප්‍රදර්ශනය කර තැබීම (එක් එක් අකුර සඳහා ඇති සම්ප්‍රදායික රූපවලින් ඇත් වී රූපය කියවන විට අදාළ ඉංග්‍රීසි අකුර ම කියවෙන රූප තෝරා ගැනීමට හැකි නම් දරුවාගේ අකුරු මතක තබා ගැනීමේ හැකියාව වඩා හොඳ වනු ඇත.)



A
a
ඒ



B
b
බී

මෙම ක්‍රියාකාරකම් සඳහා අවශ්‍යවන ඉගෙනුම් ආධාරක පහත ලිපිනය වෙත පිවිස ඩවුන්ලෝඩ් කර ගත හැක.

http://www.mapalk.com/english/englishabcd/

නිර්මාණශීලී ගුරුභවතෙකුට හෝ මවකට ඉහත සඳහන් ක්‍රියාකාරකම්වලට අමතර ව තවත් ක්‍රියාකාරකම් සාදා ගැනීමට නිදහස ඇත. එහෙත් එහි දී අකුරු මතක තබා ගැනීම යන අරමුණ ඉටු කර ගැනීමට සාදා ගන්නා එම ක්‍රියාකාරකම කෙතරම් යෝග්‍ය ද යන්න පිළිබඳ ඉහළ සැලකිල්ලක් දැක්වීම ඉතා වැදගත් වේ.

## 2 වන පියවර - තනි අකුරු ලිවීම

ඉහත පළමු පියවරේ දී හඳුනාගත් එක් එක් කැපිටල් සහ සිම්පල් අකුර නිවැරදි හැඩයෙන් සහ උසින් යුතු ව ලිවීමට මෙම දෙවන පියවරේ දී ඉගෙන ගත හැක. මේ සඳහා "තනි අකුරු ලියමු" පොත භාවිතා කළ හැක.

මේ වන විට දරුවා 1 ශ්‍රේණියේ තෙවන වාරයේ පමණ සිටීම අවශ්‍ය වේ.

සාමාන්‍යයෙන් කැපිටල් අකුරක් සිම්පල් අකුරක් මෙන් දෙගුණයක් උස වේ. එනම් සිම්පල් අකුරක් සාමාන්‍යයෙන් කැපිටල් අකුරක උසින් අඩකි.

"තනි අකුරු ලියමු" පොතෙහි කලු රූල් දෙකක් අතර ඇති ලා පැහැති රේඛාව නිවැරදි හැඩයෙන් සහ උසින් යුතු ව කැපිටල් සහ සිම්පල් යන අකුරු දෙවර්ගය ම ලිවීම සඳහා දරුවාට ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රායෝගික ව ලිවීමේ දී මෙලෙස රූල් දෙකක් අතර තවත් අමතර රේඛාවක් නැති කඩදාසිවල ලිවීමට සිදු වේ. එක් වර ම එම හැකියාව කුඩා දරුවෙකුට අත් කර ගැනීම බොහෝ දුෂ්කර බැවින් මෙලෙස අතරමැද පියවරක් යම් කාලයක් පුහුණු කිරීම දරුවාට ප්‍රයෝජනවත් වනු ඇත.

සෑම අකුරකට ම ලිවීමේ දී ආරම්භක හා අවසාන ස්ථානයක් ඇත. අනාගතයේ දී වේගවත් ලිවීමක් හිමි කර ගැනීම සඳහා මෙම ස්ථාන වැදගත් වේ.

එම නිසා දරුවාට බලා ලිවීම සඳහා එම අකුරු ලබා දීමේ දී දරුවාට පෙනෙන ලෙස ගුරුතුමා උඩ ම පේළියේ එම අකුර ලිවීම ඉතා වැදගත් වේ.

එපමණක් නොවේ. ගුරුවරයා, දරුවා අකුර ලියන ආකාරය නිරීක්ෂණය කිරීම ද ඉතා වැදගත් වේ. ගුරුවරයා අකුර ලියන විට එම ලියන ආකාරය දරුවා බලා සිටියත් දරුවා එම නිවැරදි ක්‍රමය අනුගමනය කරමින් අකුර ලිවීමට අපොහොසත් විය හැකි වීම ඊට හේතුව යි. දරුවා අකුර ලියා අවසන් වූ පසු එය නිවැරදි උසින් හා හැඩයෙන් යුතු ව තිබෙනවා පෙනුනත් දරුවා එම නිවැරදි ක්‍රමය අනුගමනය කරමින් අකුර ලියා තිබෙන්නේ ද යන්න තහවුරු කර ගත හැකි ක්‍රමයක් නැත.

## 3 වන පියවර - ලස්සන ඉංග්‍රීසි අත් අකුරු ලිවීම

මේ සඳහා දරුවා අවම වශයෙන් 2 ශ්‍රේණියේ පළමු වාරයේ වත් සිටීම වැදගත් වේ.

**අත් අකුරු ලිවීම ක්‍රම දෙකකට සිදු කළ හැක.**

1. රූලක් හැර රූලක් ලිවීම
2. රූල් නොහරිමින් ලිවීම

ප්‍රායෝගික ව භාවිතා කිරීමට සිදුවනුයේ රූල් නොහරිමින් ලිවීම යන ක්‍රමය යි. කුඩා දරුවෙකුට එක වර ම මෙම හැකියාව ළඟා කර ගත නොහැකි/අපහසු නිසා ආරම්භයේ දී රූලක් හැර රූලක් ලිවීම යන ක්‍රමයට අනුව ලියා යම් පුහුණුවක් ලබා ගැනීම වැදගත් වේ.

මේ සඳහා "පිටපත් ලියමු I" පොත යොදා ගත හැක. ඉහත 2 වන පියවරේ දී දරුවා තනි අකුරු ලිවීමේ දී අවධානය යොමු කළ කරුණු (එක් එක් අකුරක හැඩය, උස සහ ලියන දිශාව) පිළිබඳ මෙහි දී ද අවධානය යොමුකරමින් නිවැරදි සහ ලස්සන අත්අකුරු ලිවීමට ඉගෙනගත යුතු ය. පෙර පියවරේ දී මෙන් ම මෙම පියවරේ දී ද කලු රූල් දෙකක් අතර ඇති ලා පැහැති රේඛාව නිවැරදි හැඩයෙන් සහ උසින් යුතු ව කැපිටල් සහ සිම්පල් යන අකුරු දෙවර්ගය ම ලිවීම සඳහා දරුවාට ප්‍රයෝජනවත් වනු ඇත.

පියවරෙන් පියවර ගැඹුරට යාම දරුවාගේ අභිප්‍රේරණය ඉහළ මට්ටමකින් පවත්වා ගෙන යාමට උපකාර වන බැවින් පිටපත් ලිවීමේ දී මුලින් ම තනි වචන ලිවීම ද එම හැකියාව සැලකිය යුතු මට්ටමකට අත් කර ගත් පසු තනි වාක්‍ය ලිවීම ද එම හැකියාව ද සැලකිය යුතු මට්ටමකට අත් කර ගත් පසු අවසානයේ ඡේද, කවි, සංවාද යනාදිය ලිවීම ද වැදගත් වේ. වචන පිටපත් ලිවීමේ අවස්ථාව ගත් විට එහි දී ද අකුරු 3ක් 4ක් සහිත වචන මුලින් ද වැඩි අකුරු ගණනක් සහිත වචන පසුව ද ලියමින් සරල බවේ සිට සංකීර්ණ බව දක්වා ගමන් කළ හැක. වාක්‍ය පිටපත් ලියන අවස්ථාවේ දී ද ඡේද පිටපත් ලියන අවස්ථාවේ දී ද මේ ආකාරයට ම සරල බවේ සිට සංකීර්ණ බව දක්වා ගමන් කළ හැක.

බලා ලිවීම සඳහා මෙම ඉගෙනුම් ආධාරක කට්ටලයෙහි ඇති "ළමුන් සඳහා කතන්දර" පොත යොදා ගත හැක. නැතිනම් වෙනත් කතන්දර පොතක් වුව ද යොදා ගත හැක. එහි දී දරුවාගේ වයසට ගැළපෙන අකුරුවල විශාලත්වය පිළිබඳ සැලකිලිමත් වීම වැදගත් වේ.

රූල් දෙකක් අතර ඇති ලා පැහැති රේඛාව සහිත "පිටපත් ලියමු I" පොතෙහි යම් කාලයක් පිටපත් ලිවීම සිදු කළ පසු සාමාන්‍ය රූල් සහිත අභ්‍යාස පොතක රූල් හරිමින් පිටපත් ලිවීමට යොමු විය හැක. එම අභ්‍යාස පොතේ රූල් අතර රේඛාවක් හිතෙන් ඇඳ ගෙන "පිටපත් ලියමු I" පොතෙහි ලීවා හා සමාන ව ලස්සන අත් අකුරු ලිවිය යුතු ය.

ඉන් පසු රූල් නොහරිමින් පිටපත් ලිවීමට පුහුණු විය යුතු ය. මේ සඳහා "පිටපත් ලියමු II" පොත යොදා ගත හැක. එම පොතෙහි සෑම රූලක් ම පහත පරිදි කොටස් තුනකට බෙදා ඇත.

www.MAPAlk.com

| |
|---|
| 1 |
| 2 |
| 3 |
| 1 |

මෙහි 1 යනුවෙන් හඳුන්වා ඇති කොටස තුළ කිසිදු අකුරක් ලිවීම ආරම්භ නොකළ යුතු ය. 2 සහ 3 යන කොටස් දෙකෙහි කැපිටල් අකුරු ලිවිය යුතු ය. සාමාන්‍යයෙන් 3 කොටස තුළ සිම්පල් අකුරු ලිවිය යුතු ය. g j p q y යන සිම්පල් අකුරු පහේ රූලෙන් පහළට යන කොටස් ඊළඟ රූලෙහි 1 යනුවෙන් හැඳින්වෙන කොටස තුළ ලියවෙනු ඇත. b d f h i j k l t යන සිම්පල් අකුරුවල ඉහළින් ම ඇති රේඛා කොටස් සහ තිත්, 2 යනුවෙන් දක්වා ඇති කොටස තුළ ලියවෙනු ඇත. එවිට රූල් නොහරිමින් ලීවත් පේළි දෙකක ඇති අකුරු එකිනෙක ස්පර්ශ නොවී පවතිනු ඇත.
වචන, වාක්‍ය සහ ඡේද යම් කාලයක් මේ ආකාරයට ලියා පුහුණු වූ පසු සාමාන්‍ය අභ්‍යාස පොතක රූල් නොහරිමින් ලිවීමට හුරු විය යුතු ය. එහි දී “පිටපත් ලියමු II” පොතෙහි එක් එක් රූල තුළ දක්වා ඇති ලා පැහැති රේඛා දෙක හිතෙන් මවා ගෙන ලිවීම සිදු කළ යුතු ය. නැති නම් අකුරුවල හැඩය සහ උස ආරක්ෂා කර ගැනීමට දරුවා අපොහොසත් වනු ඇත.
**********************************************************

මොහොතින් මොහොත තාක්ෂණය දියුණු වෙමින් යාම තුළ අපි ක්‍රමක්‍රමයෙන් කඩදාසි සහ පෑන්වලින් ඈත් වෙමින් සිටින්නෙමු. ලියුම් වෙනුවට ඊමේල්, pdf පෙළ පොත්, ඔන්ලයින් ඉල්ලුම් පත්‍ර භාවිතා වීම උදාහරණයන් ය. මෙවන් වාතාවරණයක් තුළ යම් දරුවකුගේ අත්අකුරුවල ලස්සන පිළිබඳ පමණ ඉක්මවා කරදර වීම සුදුසු නොවේ. ලස්සන අත්අකුරු ලිවීම වැදගත් නොවේ හෝ ඒ සඳහා වෙහෙසීම නිෂ්ඵල ය වැනි අදහසක් ද මින් කිසි සේත් ම අදහස් නොවේ.
**********************************************************

www.MAPAlk.com

## <u>4 වන පියවර - ඉංග්‍රීසි අකාරාදි පිළිවෙල සහ ශබ්දකෝෂයක් භාවිතා කිරීම</u>

අපගේ “සම්පූර්ණ ඉංග්‍රීසි විසඳුම”හි පළමු පාඨමාලාවේ අවසන් පියවර වන මෙම පියවර සම්පූර්ණ කර අවසන් කරන විට දරුවා “මගේ පළමු වචන 1000”හි සඳහන් වචන වාචික ව පාඩම් කිරීම යන කාර්යයෙහි ද අවසානයට ආසන්න ව සිටිනු ඇත. අක්ෂර වින්‍යාසය රහිත ව වචන පාඩම් කිරීමෙන් පසු දරුවාට ඇත්තේ තමන් දන්නා එම වචනවලත් වචන ඉගෙනීම පිළිබඳ ඉහළ උනන්දුවක් පෙන්වන දරුවන් සඳහා යෝජනා කර ඇති අමතර වචනවලත් ඒ හා සම්බන්ධ තමන්ට අභිමත වෙනත් වචනවලත් අක්ෂර වින්‍යාසයන් අධ්‍යයනය කිරීමට යි.

ශබ්දකෝෂයක කාර්යභාරය නිවැරදි අක්ෂර වින්‍යාසය බලාගැනීම යන කාර්යයට පමණක් සීමා නොවේ. නිවැරදි අක්ෂර වින්‍යාසය දන්නා අවස්ථාවක වුව ද එම වචනයෙහි නිවැරදි උච්චාරණය අපට සැක සහිත ව තිබීමට ඉඩ ඇත. එවන්

අවස්ථාවක ද එම සැක දුරුකරගැනීම සඳහා ශබ්දකෝෂයක් ප්‍රයෝජනවත් වනු ඇත.
ශබ්දකෝෂයක ආරම්භයෙහි දක්නට ලැබෙන ඉංග්‍රීසි-සිංහල, සිංහල-ඉංග්‍රීසි සහ ඉංග්‍රීසි-ඉංග්‍රීසි යනාදි සඳහන් මඟින් කුමක් අදහස් වේද යන්න ද මෙහි දී දරුවන්ට පැහැදිලි කර දිය හැක. ඒ සඳහා ප්‍රායෝගික උදාහරණ ද සපයමින් මේ බව දරුවන්ට තව දුරටත් තහවුරු කර දීමට ද හැක. (මලලසේකර, ඔක්ස්ෆර්ඩ්.....)
"මගේ පළමු වචන 1000" හා සම්බන්ධ ව විශේෂයෙන් වචන ඉගෙනගැනීම සඳහා වැඩි උනන්දුවක් පෙන්වන සිසුන් සඳහා යෝජනා කර ඇති "තවත් වචන" පොතෙහි යම් වචන ප්‍රමාණයක අර්ථයන් දී නොමැත. ගුරුතුමාගෙන් අසා එම වචනවල තේරුම් දැනගන්නවාට වඩා දරුවා ම තමාගේ මව් බසින් තේරුම ලබා දී ඇති ශබ්දකෝෂයක් භාවිතා කර එම වචනවල තේරුම/තේරුම් සොයා ගන්නේ නම් දරුවාගේ වචන දැනුම මෙන් ම ශබ්දකෝෂයක් භාවිත කිරීමේ හැකියාව ද වර්ධනය වනු ඇත. පරිගණකගත ශබ්දකෝෂ ද මෙහි දී දරුවාට හඳුන්වා දිය හැක.
"එක ගලෙන් කුරුල්ලන් දෙදෙනෙක්"

මුල් අවස්ථාවේ දී තම මව්බසින් තේරුම ලබා දී ඇති ශබ්දකෝෂයක් භාවිතා කිරීම සුදුසු වුවත් අ.පො.ස.(සා.පෙ.) විභාගයේ ඉංග්‍රීසි ප්‍රශ්න පත්‍රයට මුහුණ දී ඉහළ ම සාමාර්ථයක් ලබාගැනීමට බලාපොරොත්තු වන සෑම දරුවෙක් ම ඉංග්‍රීසි වචනයෙහි අර්ථය ද ඉංග්‍රීසි බසින් ම ලබා දී ඇති ඔක්ස්ෆර්ඩ් වැනි ජාත්‍යන්තර මට්ටමේ ශබ්දකෝෂයක් භාවිතා කර අත්දැකීම් ලබා ගෙන තිබිය යුතු ය. මන්ද අ.පො.ස.(සා.පෙ.) විභාගයේ ඉංග්‍රීසි ප්‍රශ්න පත්‍රයට සමහර වර්ෂවල දී එවන් ශබ්දකෝෂයක එක් පිටුවක් ඇසුරින් ප්‍රශ්න කීපයක් ලබා දී ඇති බැවිනි.
මේ සියළු කරුණු සැලකිල්ලට ගෙන මෙම කට්ටලයට ඇතුළත් අකාරාදි පිළිවෙල පොත එහි සඳහන් උපදෙස් සැලකිල්ලට ගෙන සම්පූර්ණ කරන්න.

www.MAPAlk.com

**5 වන පියවර - පරීක්ෂණය**

කැපිටල් සිම්පල් පරීක්ෂණය ද පිටපත් ලිවීම පරීක්ෂණය ද අකාරාදි පිළිවෙළ පරීක්ෂණය ද අවසානයේ දරුවාට ලබා දිය හැක. වරකට එක් කොළයක් පමණක් දරුවාට ලබා දීමෙන් වඩා හොඳ ඇගයීමක් සිදු කර ගත හැක. මන්ද එක් ප්‍රශ්නයකට අදාළ පිළිතුරු තවත් ප්‍රශ්නයක් තුළ තිබිය හැකි බැවිනි.

මම
කණිෂ්ක ජයතිලක ගුරුතුමා

*************************************************************

**ඉංග්‍රීසි සමඟ සුබ ගමන් !!!**

*************************************************************

මෙම උපදෙස් මාලාවේ දෙමළ සහ ඉංග්‍රීසි පරිවර්තනයන් කියවීම සඳහා :
http://www.MAPAlk.com/english/englishabcd/

**A E I O U වලින් පටන්ගන්නා වචන ඉදිරියේ An යොදන්න.**





එහෙම හරි ද?

එතකොට මෙහෙම වෙලා ඇයි?

**U අකුර**
**ඉදිරියේ A යෙදීම**
බැංකුවට වැරදිලා ද?

UB FINANCE
A UNION BANK COMPANY




an SD card


**S අකුර**
**ඉදිරියේ An යෙදීම**
ලෝක ප්‍රකට දුරකථන
නිෂ්පාදන සමාගමට වැරදිලා ද?

**සාර්ථකත්වය සඳහා සුදුසුකම් සහිත ගුරුවරුන්ගෙන් හරි දේ හරි වේලාවට ඉගෙනගන්න.**

# Total English Solution

## සම්පූර්ණ ඉංග්‍රීසි විසඳුම

1 ශ්‍රේණිය - 5 ශ්‍රේණිය | 6 ශ්‍රේණිය - 11 ශ්‍රේණිය



වචන words → වාක්‍ය sentences → රචනා compositions



## English ABCD

හෝඩියෙන් ම පටන් ගනිමු

## MY FIRST 1000 WORDS

මගේ පළමු වචන 1000

- ✓ පළමු පියවර - නාම පද 150
- ✓ දෙවන පියවර - නාම පද 150
- ✓ තෙවන පියවර - නාම පද 175
- ✓ සිව්වන පියවර - නාම පද 175
- ✓ පස්වන පියවර - ක්‍රියා පද 300
- ✓ හයවන පියවර - විශේෂණ පද 50

දුන ගියොත් කතරගම - සෙඳුණ ගියොත් අතරමඟ

**Success has no shortcuts.** සඵලත්වයට කෙටි මං නොමැත.

## English for O/L

For best results

හොඳ ම ප්‍රතිඵල සඳහා

- ✓ Tenses
- ✓ Active voice
  Passive voice
- ✓ Direct speech
  Indirect speech
  And many more ...
- ✓ Letter writing
- ✓ Comprehension
- ✓ Essay writing
  And many more ...
- ✓ Question papers

## Basic English

මූලික ව්‍යාකරණ සහ වාක්‍ය ලිවීම


භාෂා ගුරුගෙදර

www.MAPAlk.com

071 8 111 600

Scan me